දේවි බාලිකා විද්‍යාලය - කොළඹ
**Devi Balika Vidyalaya - Colombo**

පළමු වාර පරීක්ෂණය - 2012
**First Term Test - 2012**

සිංහල භාෂාව හා සාහිත්‍යය

7 ශ්‍රේණිය

පැය එකයි

* ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

01) සිංහල අක්ෂර මාලාවේ ස්වර ගණන කීයද ? ..........................................

02) මහාප්‍රාණ අක්ෂර දෙකක් ලියන්න. .......................................... ..........................................

03) සඤ්ඤක අක්ෂර දෙකක් ලියන්න. .......................................... ..........................................

04) ගයනුකිත්ත යෙදූ වචනයක් ලියන්න. ..........................................

05) පහත වාක්‍යයේ නාම පද යටින් ඉරි අඳින්න.

කම්කරුවෝ උදලු ගෙන පාරේ වැඩට යති

06) පහත වාක්‍යයේ පූර්ව ක්‍රියා යටින් ඉරි අඳින්න.

නංගී මල් කඩා බුදුන් වැඳ පාසලට ගියා ය.

07) පහත වචන යොදා එක් වාක්‍යයක් පමණක් ලියන්න.

පහන , පහණ ..............................................................................
..............................................................................

08) පහත පද වලට සමාන පද ලියන්න.

දිවයුරු = ..........................................
පතළ = ..........................................

09) විරුද්ධ පද ලියන්න.

පුර පස = ..........................................
ව්‍යාජ = ..........................................

10) යුගල පද සම්පූර්ණ කරන්න.

1) උකුළ = ..............................  2) අපල = ..............................

11) තනි පද ලියන්න.

1) ඉර බැසයාම = ..............................

2) තමාගේම ආරක්ෂාව = ..............................

12) පහත පිරුළ සම්පූර්ණ කරන්න.

රෙදි නැන්දට .............................. කිව්වා වගේ.

* පහත වාක්‍ය බහු වචනයට හරවන්න.

13) ගොනා තණ කොළ කයි ..............................

14) ගැහැනිය දර මිටි බැන්දාය ..............................

* පහත වාක්‍ය වල හිස්තැන් අතීත කාලයෙන් පුරවන්න.

15) මැණියෝ ගමට ..............................

16) කුරුල්ලෝ අහසේ ..............................

17) බුදුන්වහන්සේ ධර්මය දේශනා ..............................

18) නුඹලා පාඩම් වැඩ වල නිරත ..............................

19) වෙළෙන්දා නංගීට වළලු ..............................

20) මව දරුවාට කිරි බීමට උදව් ..............................

(ලකුණු 20)

## <u>2 - කොටස</u>

* සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

01) පහත දැක්වෙන පාඨ කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

1. "අපි නාළා කෑම කමු"

    1) මෙය ප්‍රකාශ කළේ කවුද ? ..............................................................................

    2) ප්‍රකාශ කළේ කොහේදී ද ? ..............................................................................

    3) මෙම පාඩම කුමක් ද ? ..............................................................................

    4) මෙයට සම්බන්ධ වූ එක් අයෙකුගේ නම ලියන්න. ........................................................

2. "මගේ විශ්ව විද්‍යාලය මහජන පුස්තකාලයයි."

    1) මෙය ප්‍රකාශ කර ඇත්තේ කවුද ? ..............................................................................

    2) මේ පාඨය අයත් පාඩම කුමක්ද ? ..............................................................................

    3) මෙතුමාගේ ළමා නිර්මාණ 2 ක් ලියන්න. ..........................................

    ..........................................

3. " මම මොනතරම් අවාසනාවන්තයෙක් ද ?"

    1) මේ පාඨය ප්‍රකාශ කළේ කවුද ? ..............................................................................

    2) එය අයත් පාඩම කුමක්ද ? ..............................................................................

    3) පාඩම උපුටා ගත් මුල් පොත කුමක්ද ? ..............................................................................

    4) එහි කතුවරයා කවුද ? ..............................................................................

4. "මට අසනීප වුණා ම ළඟින් හෙල්ලෙන්නේ නෑ"

    1) මෙසේ පවසන්නේ කවුරු ගැනද ? ..............................................................................

    2) එය උපුටාගත් පාඩම කුමක් ද ? ..............................................................................

3) මේ ප්‍රකාශය කළේ කොහේදී ද ? ....................................................................................

4) පාඩම අයත් පොත රචනා කළේ කවුද ? ....................................................................................

5. 'එසේ හෙයින් දැන්මොහු යා නො දෙමි"

1) මෙසේ සිතුවේ කවුද ? ....................................................................................

2) එසේ සිතුවේ ඇයි ? ....................................................................................

3) මේ පාඩම කුමක්ද ? ....................................................................................

4) මේ සඳහා යොදාගත් කතාව කුමක්ද ? ....................................................................................

(ලකුණු 20)

(02) පහත කවිය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

තමන් හට නොසමයන් වන කලට සම
මුවින් නොබැන ඉවසනු සුදන ගරු කම
තොමින් කුමුදු විකසිත වනු දැක දැක ම
විළින් මෙන් තඹුරු මුකුලිත වේය හැම

1. මෙහි සඳහන් යහපත් අයගේ ගුණය කුමක්ද ?

2. කවියේ දක්වා ඇති රාත්‍රියට පිපෙන මල කුමක්ද ?

3. මෙහි ඇති විරුද්ධ පද යුගලය තෝරා ලියන්න.

4. නෙළුම් මලට සමාන පදයක් කවියෙන් තෝරා ලියන්න.

5. මුඛයට සමාන පදයක් තෝරා ලියන්න.

(ලකුණු 10)